7 වන පිටෙන්

ඔවුනට කිසිදු ගැටලුවක් නොමැත. ඒ ඔවුන් සමඟ ද මේ ආනයනික කණ්ඩායමේ බහුතරයක් දෙනා මීට පෙර වැඩ කර ඇති බැවිනි.

විශේෂයෙන්ම රාජපක්ෂ පවුලේ සාමාජිකයන් අත්අඩංගුවට ගැනීමට රජය බිය බවට හැඟීමක්, ක්‍රමයෙන් ජනතාව තුළ මෝදු වෙමින් පවතී. එම හැඟීම තුළ රාජපක්ෂලාට එරෙහිව එදා යහපාලන කඳවුර දමා ගැසූ දූෂණ, වංචා, චෝදනා පිළිබඳව සැකයෙන් යුතුව බැලීමට ජනතාව පටන්ගෙන ඇත. ඒ තුළ අධෛර්යයට පත්ව ඇත්තේ පාක්ෂිකයන් පමණක් නොවේ. නිලධාරින් ද දුර්වල වෙමින් සිටිති. බැසිල් රාජපක්ෂට එරෙහිව පවරා තිබූ නඩුව පැය කිහිපයකට අයින් කරගැනීම ඒකාබද්ධ විපක්ෂය ලෙස පෙනී සිටින කණ්ඩායම විශාල ලෙස අලෙවි කරමින් සිටිති. මෙම තත්ත්වය පිළිබඳව සංවේදී වෙමින් රජය ඉදිරි මාස කිහිපයේදී ඉක්මනින්ම රැඩිකල් තීන්දු තීරණවලට ගමන් කළ යුතුය.

එසේම දූෂණයට තිත තබන බව පවසමින් බලයට පැමිණි මුත් ඒ පිළිබඳව යහපාලන රජයේ ක්‍රියාකාරිත්වය ප්‍රශ්න කරන ආන්දෝලනාත්මක සිදුවීම් කිහිපයක් ගැන පහුගිය මාස 24 තුළ ප්‍රබල ලෙස මත සමාජගත විණි. මේ සම්බන්ධව ඇති තත්ත්වය යහපාලන රජයේ ශරීර සෞඛ්‍යයට ඒ හැටි සුවදායි නොමැත.

අපකීර්තියට, ලක්ව ඇති එබඳු සිදුවීම් පිළිබඳ උනන්දුවක් දක්වමින්, තමන් ඒ පිළිබඳ අවධියෙන් සිටින බව පිටතට පෙන්වීම ඉදිරිය පිළිබඳ කල්පනා කර බැලීමේ දී රජයට පාඩු නොවේ. අවධියෙන් සිටීම ලෙස අප මෙහිදී යෝජනා කරනුයේ රාජපක්ෂ සමයේ දී මෙන් සිදුවීමක් සිදුවූ පසු කමිටු පත්කිරීම ම නොවේ. ඊට වඩා එහා ගිය ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයකි. එබඳු පියවර කරා ගමන් කිරීම ජනතාව තුළ යහපාලන රජය විශ්වාසය ඉහළ නංවනු නිසැකය. විශේෂයෙන්ම පවතින සන්දර්භය තුළ රටේ ආණ්ඩුකරණය හා සෘජුව සම්බන්ධ ප්‍රධාන පෙළේ අමාත්‍යාංශවලට අලුතින් ලේකම්වරු පත්කිරීම සුදුසුය. ඒ ඇතැම් ප්‍රබල අමාත්‍යාංශවල දැනට පරිපාලන මුල් පුටු දරන්නන්ගේ ණීප්‍රගති වාර්තාව සතුටුදායක ලකුණු සීමාවේ නොමැති බැවිනි.

සැබැවින්ම පුද්ගලයකුගේ නියම වටිනාකම් මැනිය හැක්කේ මුවින් පිට වන වචනවලින් නොවේ. ක්‍රියාවන්ගෙනි. බලය දිනාගැන්මට වඩා අසීරු වනුයේ බොහෝ දුෂ්කරතා මැද දිනූ බලය රැකගැන්මය. එහිදී මූලිකවම මිතුරු වේශයෙන්, තමන් සමීපයට එන සතුරන්ගෙන් පරිස්සම් වීම වැදගත්ය. එබඳු අපකීර්තිමත් වැඩ වාර්තාවන් සහිත අනන්ත වත් දෙනා අද ණීයහපාලනයට හේත්තු වී සිටිති. වඩාත්ම අපුල දනවන කාරණය වනුයේ ඒ ඇතැමුන් යහපාලනයේ පේටන්ට් බලපත්‍ර හිමියන් සේ හැසිරීමය. ඔවුන්ගෙන් පරිස්සම් වුවහොත් එය නිසැකවම ඉදිරි කාලයේදී යහපාලනයේ දීප්තිය වැඩි කරනු ඇත. මහින්ද සමඟ එක පතේ කෑ මේ ඇතැමුන්, තවමත් පුනරුත්ථාපනය වී නොමැත. ඔවුනට ඇත්තේ කෙටිකාලීන දුෂ්ට අරමුණු පමණකි. ලාභ සන්තානය තනතුරු වරදාන මිසක ප්‍රතිපත්ති ඔවුනට වැදගත් නොමැත. යහපාලනය යනු ඔවුනට කටගැස්මක් පමණි. ජනතාවගේ හදගැස්ම මෙන්ම කටගැස්ම පිළිබඳත් මනා අවබෝධයක් ඇති මෛත්‍රීපාල සිරිසේන මහතාට මෙය අමුතුවෙන් විස්තර කර දිය යුතුව ඇතැයි අප විශ්වාස නොකරන්නෙමු. ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව, මේ මොහොතේ වඩාත් විශ්වාසය තැබිය යුත්තේ තනතුරු වරදාන පිපාසාවෙන් තමන් අසළ දැවටෙමින් දේශපාලනය කරන්නන් වෙනුවට හෘදය සාක්ෂියට එකඟව තමන් සමග දේශපාලනය කරන්නන් කෙරෙහිය. තමන්ව මුරුංගා අත්තේ තබන්නන් වෙනුවට අවංකවම තමන් විවේචනය කරන්නන් ඇගැයීම ශූර පාලකයකුගේ ගති සොබාවකි. ඒ, බලය හා තනතුරු මත හිඳිමින් අවට නිරීක්ෂණය කරන්නන්ට වඩා වැඩි යමක් අන් අයට පෙනෙන බැවිනි.

දූෂිතයන්ට දඬුවම් දීමට සමගාමීව, පිළිලයක් බව හැම කෙනෙකුම පිළිගන්නා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට මෙන්ම ජනවාර්ගික ගැටලුව දෙස යහපත් ආමන්ත්‍රණයක් සිදු කිරීමට ද යහපාලන නායකයන් ඉදිරි කාලයේ දී කටයුතු කළ යුතුය. ජනවාර්ගික ගැටලුව සම්බන්ධව, ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයා සිටින ණීතැන සෑහෙන දුරට ඉදිරිගාමීය. හුදෙක් ගැලරිය පිනවීම පමණක් දක්ෂ දේශපාලනඥයකුගේ ලක්ෂණය නොවන බව එහිදී ඔවුන් දෙදෙනාම අවබෝධ කරගෙන සිටින බව පෙනෙන්නට ඇත. ජනවාර්ගික ගැටලුව සමග තවදුරටත් ක්‍රීඩා කිරීම වෙනුවට ඊට විසඳුමක් ලබාදීම වෙනුවෙන් අවංක උනන්දුවක් ඔවුනට ඇති බව, පෙනෙන්නට තිබේ. අනාථ කඳවුරුවල වසර 27 කට වඩා වැඩි කාලයක් ජීවත්වන උතුරේ දෙමළ ජනතාව ගැන ජනාධිපතිවරයා මෑතකදී කළ කථාව රාජපක්ෂලාට එහා ගිය හෘද සාක්ෂියක් මේ කාරණය සම්බන්ධව ඔහුට ඇති බව පෙන්වයි. රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකට එක්ව සම්මුතිබද්ධ ආණ්ඩුකරණයේ නිරත මේ ස්වර්ණමය මොහොත ජනවාර්ගික ගැටලුවට සාධාරණ විසඳුමක් ලබාදීම සම්බන්ධ ඇති අවස්ථා නිසැකවම පුළුල් කරනු ලබයි. ආර්. සම්බන්දන් වැනි විපක්ෂ නායකවරයකු ධුරයේ සිටීම එම අවස්ථා තවත් ඉහළ නංවනු ලබයි. එබැවින් ඉදිරි කාලයේදී ජනවාර්ගික ගැටලුවට සැබෑ විසඳුමක් ගෙන ඒම වෙනුවෙන් වැඩි බරක් යහපාලන රජය යෙදිය යුතුය. ඒ, මේ බස් එක ද මිස් කරගත නොහැකි බැවිනි. විධායක ජනාධිපති ක්‍රමය සම්බන්ධයෙන් ද තත්ත්වය එයමය. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට එදා මැතිවරණ වේදිකාවේදී වැස්ස වූ පොරොන්දුව ඇත්තක් බවට පත්කිරීමේ යුතුකමක් ද වත්මන් පාලකයන්ට ඇත. එය, අපවත් වී වදාළ පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමියන්ට කරන ගෞරවයක් නිසාම නොවේ. තමන් කෙරෙහි විශ්වාසය තබමින් අති දුෂ්කර මොහොතක ඡන්දය සලකුණු කළ ජනතාව වෙනුවෙන් ද එසේ කිරීමේ යුතුකමක් ඔවුන්ට තිබේ.

සහතිකවම ජනාධිපතිවරයා ප්‍රමුඛ යහපාලන රජයේ ඉදිරිය තීරණය වනු ඇත්තේ ඉහත කී කාරණා සම්බන්ධයෙන් ඔවුන් දක්වන සංවේදීතාවේ, උනන්දුවේ තරම මතය. අවසාන වශයෙන් එක දෙයක් සඳහන් කිරීමට කැමැත්තෙමු. ලෝකයේ සියල්ල, අස්ථිරය. අද මහා යෝධයන් හෙට අඟුටුමිට්ටන් වූ කථා ඉතිහාසය තුළ එමටය. ඒ පිළිබඳ සජීවී සාක්ෂි ශ්‍රී ලංකාව තුළ මේ මොහොතේත් දැකගත හැකිය. ඒ ඉතිහාසය තුළ වත්මන් පාලකයන්ට හිමි තැන, මීළඟ වසර දෙක තුන තුළ අනිවාර්යයෙන්ම කාලය විසින් තීරණය කරනු ඇත.

colombotelegraph.com

# සාහිත්‍යකරුවා සහ ප්‍රතිරූපය

නිර්වර්ණ
උපේක්ෂා සේනානායක
COLOURLESS

සාහිත්‍යකරුවා පවතින දේශපාලන ප්‍රවාහය තුල තම අනන්‍යතාව රැකගනිමින් රැඳීසිටිය යුතු ය යන පදනමේ පිහිටා සාහිත්‍යකරුවන් විසින්ම තම සහෘදයින්ව විවේචනය කරනු ලබන අවස්ථා මම කොතෙකුත් දැක ඇත්තෙමි. සාහිත්‍යකරුවා තම නිර්මාණය තුලින් ප්‍රකාශයට පත් කරන සමාජ දේශපාලන කාරණය වෙනුවෙන, සරලව කිවහොත් තම ප්‍රකාශනය වෙනුවෙන් පෙනී සිටිය යුතුය යන මතවාදය මෑතකදී අප කවුරුත් මුණගැසුණු එක්තරා හැන්දෑවක කථා බහට ලක් වූ කාරණයක් විය. නිර්මාණය සහ නිර්මාණකරුවාගේ යථා ස්වරූපය අතර පවතින නොගැලපීම දඬුවම් ලැබිය හැකි වරදක් තරමට බරපතල බව ඒ හැන්දෑවේ කථා බහ කෙරුණි.

නිර්මාණකරුවෙකුගේ පෞද්ගලික ජීවිතය මත පිහිටා ඔහුගේ නිර්මාණ වින්දනය කළා නම් කුෂ්වන්ත් සිංගේ රසබර කෘති කිසිවක් හෝ පබ්ලෝ නෙරූදා ගේ ඉමිහිරි කවි කිසිවක් මට කිසිදිනක රසවිඳීමට නොහැකි වන බව මම දනිමි. අප සීගිරි කවි කියවා රසවින්දේ කවියාගේ නම වත් අවම වශයෙන් නොදැනය. නිර්මාණය තුලින් කථාබහට ලක්වන දේශපාලනය කාරණය සහ නිර්මාණකරුවාගේ පක්ෂ(පාට) දේශපාලනය අතර පවතින නොගැලපීම පිළිබඳව තුන්වන ලෝකයේ රටක පවතින තත්ත්වය මවිත විය යුතු හෝ කෙස් පැලෙන තර්ක ඉදිරිපත් කළ යුතු කරුණක් ලෙස මම පුද්ගලිකව නොතකමි. මේ පදනම මත පිහිටියේ නම් අවම වශයෙන් මෙල්බර්න් නගරයේ සිටින අප හොඳින් හඳුනන බහුතරයක් කවියන්ගේ කවි අපට රසවිඳීමට තබා කවිපොත අතට ගැනීමට වත් නොසිතෙන තරමට ඇතැම් කවින්ගේ යථාරූපය සහ ඔවුන්ගේ ප්‍රකාශන එකිනෙකට පරස්පරය.



සාහිත්‍යකරුවා තම අවපීඩිත මානසිකත්වය සමාජයට සම්ප්‍රේෂණය නොකළ යුතු බවට තර්ක කරනුයේ අවපීඩනය සඳහා වෛද්‍ය උපදෙස් මත බෙහෙත් පෙති ගිලිමින් කවි ලියන කවියන්ම විම හාස්‍යජනකය. සාහිත්‍යකරුවා තම ඉලක්කගත සමාජ දේශපාලන වටපිටාව (උදා:කොමියුනිට්ස්) අරමුණු කරගනිමින් නිර්මාණකරණයේ යෙදිය යුතු අතර තම සැබෑ ප්‍රතිරූපය සමාජයට යහපත් දැක්මක් ඇතිකරවන්නක් විය යුතු බවට තර්ක කරනුයේ පිරිසක් මැද සිටියදී දුම්පානය කිරීම අසංවර යැයි අවම වශයෙන් නොදන්නා කවියන්ය.

ඔවුන් නොදැනුවත්වම සාමාන්‍ය සමාජයෙන් අපගමනය වි අවසන්ය. මේ බෙදවාචකය ඔවුන්ටම නොදැනීම තරම් තවත් අවාසනාවන්ත තත්ත්වයක් තිබේද? ඔවුහු ධනේශ්වර සමාජයක පවතින අවරගනයේ ලක්ෂණ සියල්ල තම චරිත තුලින් ප්‍රකට කරමින් ෂාක් සහ ෂප්දබ ගැන කථාකිරීම මට නම් විහිළුවකි.

වඩා වැදගත් වන්නේ වෙබ්අඩවි හරහා විකුණන අදහසින් මනුශ්‍යත්වය ගැන කථා කිරීම නොව සැබෑ මනුශ්‍යත්වය අව්‍යාජ ලෙස ප්‍රකාශ කිරීමය. අද ලාංකික සාහිත්‍ය ලෝකය තුල සැරිසරන්නේ රාජ්‍ය නොවන සංවිධාන වල සේවය කරමින් මිනිසත්කම වෙනුවෙන් කිඹුල් කඳුළු හෙලන ප්‍රදර්ශන කාමයෙන් අන්ධ වූ බහුබූතයන් විම, පාඨකයින්ගේ අභාග්‍යය බව අවසන් වශයෙන් ලියා තබමි.